# සිංහල සංස්කෘතිය හා විප්‍රවාසී කලාකරුවාගේ කාර්යභාරය



*19වන ශත වර්ෂය අගභාගයේ අප මව්බිමේ බිහිවූ විශිෂ්ඨතම සංගීතඥයෙකු වන සාදිරිස් මාස්ටර්ගේ එක් පුතකු දූන් ජීවත් වන්නේ ඕස්ට්‍රේලියාවේ ය. තම දූ දරුවන් සමඟ ඕස්ට්‍රේලියාවේ පදිංචියට විත් සැඳෑ සමය ගත කරන අප රටේ විසූ විශිෂ්ටතම ගාන්ධර්වයකු වූ එතුමා ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ය. මුලින්ම මෙල්බර්න් නුවර පදිංචියට විත් දූන් සිඩ්නි නුවර ජීවත්වන එතුමා තම සංගීතඥානය මෙපුර වෙසෙන දූ දරුවන්ට බෙදා දෙමින් නිහඬව සේවය කරන සංගීතඥයෙ කෙළ පැමිණි අග්‍රධර සංගීතවරයෙකු හා කලාකරුවකු වේ. මෙරට සිංහල සංස්කෘතිය හා ශ්‍රී ලාංකිකයන්ගේ සංස්කෘතික කාර්යභාරය පිළිබඳව මම එතුමා සමඟ පිළිසඳරක යෙදුනෙමි.*

**ඔබතුමා ඒ කාලේ අපරටේ විශිෂ්ට ගි තනු නිර්මාණය කළ බොහෝ ජනප්‍රිය ගායක ගායිකාවන් බිහිකළ, ජනප්‍රිය රැල්ලේ මෙන්ම සම්භාව්‍ය චිත්‍රපට වෙනුවෙන් දයකත්වය සැපයූ කීර්තිධර සංගීතඥයෙක්. ඇයි ඔබ නිහඬවම සැඳෑ සමය මෙවැනි රටක සිර කිරීමට තීරණය කළේ ?**

මම මගේ සංගීත ජීවිතය පිළිබඳව මම තෘප්තිමත්. අතීතය වර්තමානය හා අනාගතය පිළිබඳව මගේ කළකිරීමක් නැහැ. මම මෙහෙට ආවෙ අහම්බෙන්. මම මෙහෙට ආවෙ කළකිරීමකින් නොවෙයි. එහෙත් දේශපාලඥයන් පිටුපස කලාකරුවන් ගැටීමේ ප්‍රවණතාවය එන්න එන්නම වැඩිවීමේ ලක්ෂණය අද මා දකිනවා. එදා ආර් ප්‍රේමදාස මැතිතුමා මගේ සංගීත දැනුම අඳුනාගෙන මට ටවර් හෝල් රඟහල නාට්‍යයෙන් මෙන්ම ගම් උදාවටද සංගීතයෙන් මාව සම්බන්ධ කරගත්තා. අද අපේ සංගීතඥානයෙන් ප්‍රයෝජන ගන්න පිරිස වඳවීගෙන යන්නෙ. තරු බිහිකරන රටකට අපෙන් කුමන ප්‍රයෝජනයක්ද ? පෙරදිග සංගීතය, ජන සංගීතය යටපත් වෙලා අපේ ජාතික සංගීතය යටපත් වෙල අහුලගත්තු කෑලි සමඟ තමයි අපේ ජාතික සංගීතය දැන් ඉදිරියට එන්න දඟලන්නේ. අපරදිග සංගීතය අනවශ්‍යයි කියලා මම කියන්නෙ නැහැ. නමුත් අපේ ජන විඥානයට අනුව සංගීත සැකැස්මත් නැහැ. අද කලාකරුවො දේශපාලඥයන් පිටුපස යන්නෙ මුදලට වාසියට ජනප්‍රියත්වයට.

**ඔබ අපේ රටේ නාම්‍යය කලාවේ මං සළකුණක් තැබූ හුණුවටයේ කතාවේ සංගීත අධ්‍යක්ෂවරයා. එහි සංගීතය අපරටේ පරපුරින් පරපුරට ශ්‍රවණය කළහැකි අපූරු සංගීත සංයෝජනයක්. අද අපේ**

**චිත්‍රපට හා නාට්‍යය සංගීතය පිළිබඳව ඔබට හිතෙන හැටි ?**

අද චිත්‍රපට සංගීතයක් හරි හැටි තියනවද කියලා අපි හිතල බලන්න ඕනෙ. එදා චිත්‍රපටිය හා සංගීතය කියන්නෙ එකක්. හොඳ සින්දු රසවත් සංගීතයක් නැත්නම් චිත්‍රපට බලන්න ප්‍රේක්ෂකයෝ එන්නෙ නැහැ. ගායකයා වාදකයා චිත්‍රපටිය කියන්නෙ එක්වූ එකම පවුරක් විදියට තමයි ප්‍රේක්ෂකයා නිර්මාණය රස වින්දෙ. මී මැස්සා රොන් අරගන්නෙ එක මලකින් විතරක් නොවෙයි. සංගීතයක් රසවත් වෙන්නත් ඒ විදියට මම ටවර් හෝල් රඟහලේ පැරණි නාට්‍යවලට නැවත



සංගීතය නිර්මාණය කළේ වර්තමාන ප්‍රේක්ෂක පරපුරට රසවත් ලෙස නැවත ඒම විඳගන්න. නමුත් එහෙම කලා කියලා පැරණි නාට්‍යවලට අබමල් රේණුවක් තරම්වත් හානියක් වුණේ නැහැ. ඒවා එදාටත් වැඩිය හොඳින් ප්‍රේක්ෂකයා වැළඳ ගත්තා. එදා කලාකරුවන් අතර හොඳ එකමුතුකමක් තිබුණා. මුදල ගැන හිතලම නෙමෙයි නිර්මාණවලට දායකත්වය දෙන්නෙ. හුණුවටයේ කතාවට මම අළුත් සංගීත භාණ්ඩ උපයෝගී කොට ගත්තා. මුළු නාට්‍යය පුරාවටම ප්‍රේක්ෂකයන් එම සංගීතය සමඟ බැඳිලා හිටියා. අපරටේ තරුණ පරපුර, සිසු පරපුර තවමත් ඒ සංගීතය හා බැඳී ජීවත්වෙනවා.

**ඔබ සරල මෙන්ම රාගධාරී සංගීත ස්වරඥානයෙන් පරිපෝෂිත පරිණතයෙක්. ඔබ බිහිකළ කලාකරුවන් රැසක් අදටත් ජනප්‍රියයි. අපරටේ ජනප්‍රිය කලාවත් සමඟ බිහිවූ ප්‍රබුද්ධ හා පීචන් කලාව පිළිබඳ ඔබේ දැක්ම කෙබඳුද ?**

කලාවට එහෙම භේදයක් නැහැ. දැන් ජෝතිපාල ගත්තොත් ඔහු හොඳ මිහිරි කටහඬක් තිබූ ගායකයෙක්. පීචන් වේවා ජනප්‍රිය වේවා ප්‍රබුද්ධ වේවා ගීයක් ගායනා කිරීමට හොඳ සර්වඥානයක් තිබිය යුතුයි. එම ඥානය නැති අයකුට මිහිරිව ස්වරවල පිහිටල ගායනා කරන්න බැහැ. මා නිර්මාණය කළ -ආලෙ මිහිර පෙන්නා" ගීය ජෝති හරි අපූරුවට ගායනා කළා. ඔය එක් එක් ගුරු කුළ විසින් තමන්ගේ පැවැත්ම වෙනුවෙන් හදාගත්ත ඒවා තමයි. යහපත් නිර්මාණශීලී කලාකරුවෙකුට ඔය කිසි බේදයක් නැහැ මේක විශ්ව භාෂාවක්. ඒ භාෂාව නිර්මාණශීලී නම් කවදත් ජනප්‍රියයි. කලාවට ජනතාව කවදත් ප්‍රියයි. සංගීතය අදෘෂ්‍යමාන විෂයක්. මේ ලෝකයේ මුල්ම විෂය සංගීතයයි.

**මම ඉතාමත් සුළුවෙන් ඔබේ අතීතයට පිවිසුණේ ඔබ ගත කරන අද පරිසරයට එබී බලන්නට. විප්‍රවාසීන් වන ඔබත් මමත් මෙරටේ ජීවත්වන කාලය තුළ, එකිනෙකා තුළ පවතින අන්‍යෝන්‍ය බැඳීම ශක්තිමත් වී ඇත්තේ සංස්කෘතිය නැමැති පවුර මතින්. එලෙසම ඒ හා බැඳුණු කලාව සංගීතය තුළිනුත් අපිට ඈත්වෙන්නට බැහැ. මෙරට කලා ශිල්පීන් හා කලාව පිළිබඳ ඔබේ අදහස ?**

අප මව්බිමෙන් මෙරටට ඇවිල්ල ඉන්නෙ කලා ශිල්පීන් නෙමෙයිනෙ. ඔවුන්ට තියෙන්නෙ වෙනත් විෂයානුබද්ධ දක්ෂතා. ඔවුන් මෙරට තුළ මෙ පරිසරය තුළ කලාව නැමැති විෂයය බොහෝ පරිස්සමෙන් පරිහරණය කල යුතුයි. නමුත් එසේ බුද්ධිමත්ව එය පාවිච්චිකරන පාටක් පේන්න නැහැ. මේ උත්තරීතර කලාවෙන් මේ අපේ සිංහල ශ්‍රී ලාංකික ප්‍රජාවට ලොකු සේවයක්

